## 7.මුදල් හා මූල්‍ය ආයතන

100. පහත දැක්වෙන X තීරුවේ මුදල් වර්ග ද, Yතීරුවේ එම මුදල් වර්ගවලට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ව්‍යවහාර මුදල් | A - ජංගම ගිණුම්වල ශේෂ |
| 2. බැංකු මුදල් | B - කාසි හා නෝට්ටු |
| 3. විද්‍යුත් මුදල් | C - ස්ථාවර තැන්පතු |
| 4. ආසන්න මුදල් | D - ණයපත් |

ඉහත දැක්වෙන මුදල් වර්ගවලට අයත් නිදසුන් නිවැරදි ව අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A, B, Cහා Dය.
(2) A, D, B හා Cය.
(3) B, A, D හාCය.
(4) B, A, C හා Dය.
(5) B, C, Aහා Dය.

(………)

101. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පමණක් අවසරය ඇති නමුත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අවසර අහිමි මූලිකම ලක්ෂණය වන්නේ,

(1) ජංගම ගිණුම් පවත්වා ගෙන යාමට හැකිවීමයි.
(2) කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු පවත්වාගෙන යාමට හැකිවීමයි.
(3) ව්‍යවසායකයින්ට ණය සැපයීමට හැකිවීමයි.
(4) ජංගම ගිණුම් හැර අනෙකුත් තැන්පතු පවත්වා ගෙන යාමට හැකිවීමයි.
(5) කල්බදු පහසුකම් සැපයීමට හැකිවීමයි.

(………)

102. ඒකක භාරයකට අයත් පාර්ශ්වයන් නිවැරදිව දැක්වෙන කාණ්ඩය වන්නේ,

(1) ඒකක භාරකරු, ඒකක අරමුදල, ඒකක හිමියන්
(2) ඒකක භාරකරු, අරමුදල් කළමනාකරණ සමාගම්, ඒකක හිමියන්
(3) ඒකක භාරකරු, ප්‍රාරක්ෂකයන්, ආයෝජකයින්
(4) අරමුදල් කළමනාකරණ සමාගම්, තැරැව්කරුවන්, ආයෝජකයින්
(5) සුරැකුම්පත් හුවමාරු (ඇපකාර) සමාගම, අරමුදල් කළමනාකරණ සමාගම්, තැරැව්කරුවන්

(………)

National Institute of Education

103. බැරපත් මගින් ගනුදෙනු කිරීමට සාපේක්ෂව, හරපත් මඟින් ගනුදෙනු කිරීමේ දී ගනුදෙනුකරුට වාසියක් වන්නේ,

(1) පොලියක් ගෙවිය යුතු නොවීම යි.

(2) ගිණුමක් තිබීම අනිවාර්ය නොවීම යි.

(3) ණයට විකිණීම සඳහා මුදල් ලැබීම ස්ථිර වීම යි.

(4) යම් කාලසීමාවක් සඳහා පොලී රහිත ණයක් වීම යි.

(5) පිරිවැටුම වැඩි වීම යි.

(………)

104. පහත දැක්වෙන්නේ ශ්‍රී ලංකවේ මූල්‍ය පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආයතන කිහිපයකි.

A - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්

B - රක්ෂණ සමාගම්

C - ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්

D - සේවක අර්ථ සාධක අරමුදල

E - ඒකකභාර

F - සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල

ඉහත සඳහන් ආයතන අතරෙන් ගිවිසුම් ගත ඉතිරි කිරීමේ ආයතන පමණක් නිවැරදිව ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, C, E

(2) B, D, F

(3) B,C, F

(4) D, E, F

(5) B, D, F

(………)

105. පහත දැක්වෙන්නේ ණයපතකට සෘජුවම මෙන්ම වක්‍රව විවිධ ආකාරයෙන් සම්බන්ධ පාර්ශ්ව වේ.

A - කාඩ්පත් හිමියන්

B - ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන

C - වෙළෙන්දා

D - ණයපත් සංගමය

E - ගිණුම් හිමියා

F - කාඩ්පත් නිකුත් කරන ආයතනය

G - ණය තොරතුරු කාර්යාංශය

ණයපතක් මගින් ගනුදෙනු කිරීමේ දී සෘජුව සම්බන්ධ පාර්ශ්ව පමණක් පෙළ ගැසූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) A,C, D හා E ය. (2) A,C,D හා Fය. (3) C,D,F හා G ය.

National Institute of Education

(4) B,C,D හා E ය. (5) A,D,F හා G ය.

(………)

106. පහත දැක්වෙන වගුවේ X තීරුවේ විද්‍යුත් මුදල් වර්ග ද,Y තීරුවේ ඊට අදාළ පැහැදිලි කිරීම් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ණයපත් | A - මුදල් වටිනාකමක් සහිත Chipඑකක් අන්තර්ගත වරින් වර මුදල් ගබඩා කළ හැකි විවිධ මූල්‍ය පහසුකම් සහිත කාඩ්පතකි. |
| 2. හරපත් | B - බැංකු ගිණුම් නොමැති අයට පවා කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් විශේෂයකි. |
| 3. පෙර ගෙවුම් කාඩ්පත් | C - තම ගිණුමේ ඇති මුදල් සහ වෙළෙඳසල් ගෙවීම් පියවීමට ATMභාවිතයෙන් මුදල් ලබා ගත හැකි කාඩ්පතකි. |
| 4. ස්මාර්ට් කාඩ්පත් | D - නිශ්චිත වටිනාකමක් දක්වා මුදල් ද, අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ද, ලබා ගත හැකි ණය පදනමක් මත මූල්‍ය ආයතන විසින් නිකුත් කරන කාඩ්පතකි. |

ඉහත දැක්වෙන විද්‍යුත් මුදල් වර්ගවලට අයත් පැහැදිලි කිරීම් අනුපිළිවෙළින් නිවැරදිව දැක්වෙන කාණ්ඩය වන්නේ,

(1) D,A,B හාCය. (2) A,C,B හාDය. (3) D,C,A හාBය.

(4) B,C,D හාA ය. (5) D,C,B හාAය.

(………)

107. වෙළෙඳ ආයතන මඟින් ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති වෙළෙඳ ණය මිල දී ගැනීම ප්‍රධාන කාර්යය ලෙස සිදු කරනු ලබන ආයතන හඳුන්වන්නේ,

(1) ප්‍රාරක්ෂකයින් ලෙස ය.
(2) ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් ලෙස ය.
(3) ආයෝජන කළමනාකරුවන් ලෙස ය.
(4) සාධ්‍යකරණ සමාගම් ලෙස ය.
(5) ප්‍රාථමික වෙළෙඳුන් ලෙස ය.

(………)

108. පහත දැක්වෙන්නේ මුදලක පවතින ලක්ෂණ කිහිපයකි.

A - පොදු පිළිගැනීම. B - නෛසර්ගික අගය ඉහළ වීම.

C - ලෝහමය අගයක් පැවතීම. D - අනුකරණයේ දුෂ්කරතාව.



National Institute of Education

E - කල් පැවැත්මක් තිබීම. F - දුලබ වීම.

එම ලක්ෂණ අතරෙන් හොඳ මුදලක ලක්ෂණ පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) A,B,C (2) A,D,E (3) A,E,F (4) A,D,F (5) A,E,C

(………)

109. ශ්‍රී ලංකාවේ බැංකු අතර ඉහළ වටිනාකමකින් යුක්ත ගෙවීම්, සුළු කාලයකින් පියවීම සඳහා පිහිටුවා ඇති පද්ධතිය වන්නේ,

(1) ලේඛන රහිත සුරැකුම්පත් පද්ධතිය යි.
(2) තත්කාලීන දළ පියවුම් පද්ධතිය යි.
(3) අන්තර් බැංකු විද්‍යුත් සන්නිවේදන පද්ධතිය යි.
(4) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය යි.
(5) ලංකා සෙට්ල් පද්ධතිය යි.

(………)

110. මුදල් වර්ග X තීරුවේද, එම මුදල් භාවිත පිළිබඳ Yතීරුවේ දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ද්‍රව්‍ය මුදල් | A - ණයපත් හා හරපත් |
| 2. ලෝහ මුදල් | B - චෙක්පත් |
| 3. කඩදාසි මුදල් | C - රන් හා රිදී |
| 4. බැංකු මුදල් | D - රුපියල් නෝට්ටු |
| 5. විද්‍යුත් මුදල් | E - සිප්පි කටු හා දුම්කොළ |

Xතීරුවට අනුවYතීරුව අනුපිළිවෙළින් ගැළපෙන කාණ්ඩය තෝරන්න.

(1) A,C,B,D,E (2) E,C,D,B,A (3) B,A,C,D,E
(4) A,B,E,C,D (5) C,B,A,D,E

(………)

111. කමලසිරි විසින් රු. 10,000ක භාණ්ඩ තොගයක් නිමල්ගෙන් මිලට ගෙන ඒ සඳහා චෙක්පතක් නිකුත් කළේ ය. කමලසිරි විසින් ඒ චෙක්පත මහරගම ශාඛාවේ තැන්පත් කරන්නේ නම් පහත රේඛන අතරෙන් වඩාත් සුරක්ෂිත රේඛනය වන්නේ,

(1) ආදායකයාගේ ගිණුමට පමණයි.
(2) ආදායකයාගේ ගිණුමට පමණයි. ලංකා බැංකුව, මහරගම
(3) ලංකා බැංකුව

(4) ලංකා බැංකුව, මහරගම

(5) ගනුදෙනුකළ නොහැක.

(.........)

112. මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්ය වන්නේ තැන්පතු භාර ගැනීමයි. බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පමණක් රැස් කළ හැකි, මූල්‍ය ආයතනවලට රැස් කළ නොහැකි තැන්පතු වර්ගය වන්නේ,

(1) කාලීන තැන්පතු
(2) ඉතුරුම් තැන්පතු
(3) ඉල්ලුම් තැන්පතු
(4) ස්ථාවර තැන්පතු
(5) ධනයෝජන තැන්පතු

(..........)

113. බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමුපකාර ග්‍රාමීය බැංකුවක් සමඟ සසඳන විට ග්‍රාමීය බැංකුවකට පමණක් ආවේණික ලක්ෂණය වන්නේ,

(1) ඉල්ලුම් තැන්පතු භාර ගැනීම.
(2) උකස් කටයුතු කිරීම.
(3) ඉතුරුම් හා ස්ථාවර තැන්පතු ගිණුම් පවත්වා ගෙන යාම.
(4) සාමාජිකයන්ට ණය පහසුකම් සැපයීම.
(5) ජල හා විදුලි බිල් පත් ගෙවීමේ පහසුකම් සැපයීම.

(.........)

114. කුලීපිට ගැණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහාම ආරම්භ වුවද වර්තමානයේ දී තම ව්‍යාපාර කටයුතු විවිධ ක්ෂේත්‍රවලට පුළුල් ඇති ආයතන නම්

(1) කල්බදු සමාගම් ය.
(2) මූල්‍ය සමාගම් ය.
(3) බලපත්‍රලාභී වාණිජ බැංකු ය.
(4) බලපත්‍රලාභී විශේෂිත බැංකු ය.
(5) සමුපකාර ග්‍රාමීය බැංකු ය.

(.........)

115. A තීරුවේ මූල්‍යායතන ද B තීරුවේ එම මූල්‍යායතනවල විශේෂිත කාර්යක් ද පහත දක්වා ඇත.

| A | B |
|---|---|
| 1. බලපත්‍රලාභී වාණිජ බැංකු | A - කුලීපිට ගැණුම් පහසුකම් සැපයීම. |
| 2. වණික් බැංකු | B - ඉල්ලුම් තැන්පතු ගිණුම් පවත්වාගෙන යාම. |
| 3. ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් | C - ව්‍යාපෘති වාර්තා සැකසීම. |
| 4. මූල්‍ය සමාගම් | D - නව ව්‍යවසායකයන්ට ප්‍රාග්ධනය සැපයීම. |

Aතීරුව හා Bතීරුව නිවැරදිව ගැළපීමෙන් ලැබෙන පිළිතුර වන්නේ,

(1) 1 - B,2 - C, 3 - D, 4 -A

(2) 1 - B,2 - A, 3 - D, 4 -C



National Institute of Education

(3) 1 - A, 2 - D, 3 - C, 4 -B
(4) 1 - C,2 - B, 3 - A, 4 -D
(5) 1 - D,2 - C, 3 - B, 4 -A

(………)

116. පහත දක්වා ඇත්තේ මුදලින් ඉටු කෙරෙන කාර්ය 4ට නිදසුන්ය.

A - වර්ෂ 5කින් ආපසු ගෙවීමේ පොරොන්දුව මත සමන් රු. 500, 000ක ණය මුදලක් ලක්දේශ් මූල්‍යායතනයෙන් ලබා ගෙන ඇත.

B - ත්‍රීරෝද රථය රු. 400, 000කට තක්සේරු කරන ලදී.

C - සේවකයින්ට මුදලින් වැටුප් ගෙවීම.

D - රු. 150, 000ක මුදලක් ඉතිරි කිරීම.

ඉහත දක්වා ඇති A,B,CහාD යන කොටස්වලින් ගම්‍ය වන්නේ මුදලින් ඉටු කෙරෙන කුමන කාර්යද? යන්න සඳහන් වන්නේ කුමන වරණයෙන් ද යන්නතෝරන්න.

(1) විලම්බිත ගෙවුමක්වීම, වටිනාකමේ මිනුමක්වීම, විනිමය මාධ්‍යයක් වීම හා වටිනාකමේ සන්නිධියක්වීම වේ.

(2) වටිනාකමේ මිනුමක් වීම, විලම්බිත ගෙවුමක් වීම, වටිනාකමේ සන්නිධියක්වීම හා විනිමය මාධ්‍යයක්වීම වේ.

(3) විනිමය මාධ්‍යයක්වීම, වටිනාකමේ මිනුමක් වීම, වටිනාකමේ සන්නිධියක් වීම හා විලම්බිත ගෙවුමක්වීම වේ.

(4) මිනුම් ඒකකයක්වීම,විලම්බිත ගෙවුමක්වීම, වටිනාකමේ සන්නිධියක්වීම හා විනිමය මාධ්‍යයක්වීම වේ.

(5) වටිනාකමේ සන්නිධියක්වීම, වටිනාකමේ මිනුමක්වීම, විනිමයමාධ්‍යයක්වීම හා විලම්බිත ගෙවුමක්වීම වේ.

(………)

117. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් නියාමනය කිරීමේ බලධාරියා ලෙස කටයුතු කරන ආයතනය වන්නේ,

(1) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(2) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
(3) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
(4) ශ්‍රී ලංකා මහ බැංකුව
(5) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(………)

118. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන මුදල් නෝට්ටු නෛසර්ගික අගයකින් තොර වුවද, මහජනතාව සිය ගනුදෙනු සඳහා නිරන්තරයෙන්ම යොදා ගනී. එයට හේතුව මෙම මුදල්

(1) ආසන්න මුදලක් නිසාය.



National Institute of Education

(2) අධිබලැති මුදලක් නිසාය.

(3) සංකේත මුදලක් නිසාය.

(4) අජ මුදලක් නිසාය.

(5) ප්‍රඥප්ති මුදලක් නිසාය.

(.........)

119. ශ්‍රී ලංකා මහ බැංකුවේඅරමුණු හා කාර්යයන් කිහිපයක් පහතින් දැක්වේ.

A - ආර්ථික හා මිල ස්ථායීතාව ඇති කිරීම.

B - මුදල් ප්‍රතිපත්තිය මෙහෙය වීම.

C - මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ඇති කිරීම.

D - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.

E - රජයේ මූල්‍ය හා ආර්ථික උපදේශකයා ලෙස කටයුතු කිරීම.

ඉහත ඒවා අතරෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ද්විත්වයවන්නේ,

(1) A හා E ය. (2) B හා D ය. (3) C හා E ය.

(4) A හා C ය. (5) D හා E ය.

(.........)

120. පොදු පිළිගැනීම මත භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේ දී භාවිතයට ගනු ලබන "**කාසි හා නෝට්ටුවලින්**" යුක්ත වලංගු මුදල් නිකුත් කරනු ලබන ආයතනය වන්නේ,

(1) මහජන බැංකුව යි. (2) ශ්‍රී ලංකා මහ බැංකුව යි.

(3) ලංකා බැංකුව යි. (4) ජාතික සංවර්ධන බැංකුව යි.

(5) තෝමස් ඩිලාරූ සමාගම යි.

(.........)

121. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියෙහිකටයුතු කරන බලපත්‍රලාභී විශේෂිත බැංකු පමණක් අඩංගු කාණ්ඩය වන්නේ,

(1) ශ්‍රී ලංකා මහ බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව

(2) ජාතික ඉතිරි කිරීමේබැංකුව, ලංකා බැංකුව, නිවාස සංවර්ධන බැංකුව

(3) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව

(4) ජාතික සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(5) ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, මහජන බැංකුව

(.........)

122. E – cash හෝ E – purse ලෙස හඳුන්වනු ලබන විද්‍යුත් මුදල් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) ණයපත්, හරපත්, ස්මාර්ට් කැෂ් කාඩ්, ඩිජි කැෂ්

(2) කාසි හා නෝට්ටු, ස්මාර්ට් කෑෂ් කාඩ්, හරපත්, ආසන්න මුදල්


(3) වාණිජ පත්‍රිකා, ණයපත්, හරපත්, ද්‍රව්‍ය මුදල්

(4) නිමිති මුදල්, වලංගු මුදල්, ඩිජි කෑෂ්, හරපත්

(5) ණයපත්, වාණිජ පත්‍රිකා, හරපත්, ඩිජි කෑෂ්

(………)

- පහත දක්වා ඇති චෙක්පතේ ආදර්ශය අනුව 123, 124, හා 125 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සනත් අබේනායකගේ ජංගම ගිණුම ගාල්ල ලංකා බැංකුවේ පවතී.




123. ඉහත රේඛනයෙන් අදහස් වන්නේ,

(1) සනත් අබේනායකට ගනුදෙනු කළ නොහැකි චෙක්පතක් බවයි.

(2) එම චෙක්පත පිටසන් කර අන් අයෙකුට පැවරිය නොහැකි බවයි.

(3) පැවරුම්ලාභියාට හොඳ හිමිකමක් ලැබෙන බවයි.

(4) පවරන්නාට වඩා හොඳ හිමිකමක් පැවරුම්ලාභියාට ලැබෙන බවයි.

(5) පවරන්නාට තිබෙන හිමිකම ම පැවරුම් ලාභියාට ද ලැබෙන බවයි.(………)

124. චෙක්පතේ සඳහන් ආදායකයා, අණකරු හා අණලදු පිළිවෙළින්,

(1) ලංකා බැංකුව, සමන් විජේසේකර හා සනත් අබේනායක වේ.

(2) සනත් අබේනායක, ලංකා බැංකුව හා සමන් විජේසේකර වේ.

(3) සමන් විජේසේකර, සනත් අබේනායක හා ලංකා බැංකුව වේ.

(4) සමන් විජේසේකර, ලංකා බැංකුව හා සනත් අබේනායක වේ.

(5) සනත් අබේනායක, සමන් විජේසේකර හා ලංකා බැංකුව වේ.

(………)

125. මෙම චෙක්පතේ M. I. C. R.තීරුවේ දක්වා ඇති 015150 හා 0072497694 යන අංකවලින් දැක්වෙන දෑ අනුපිළිවෙළින්,

National Institute of Education

(1) බැංකු අංකය හා ගිණුම් අංකය වේ.
(2) චෙක්පත් අංකය හා ගිණුම් අංකය වේ.
(3) ගිණුම් අංකය හා චෙක්පත් අංකය වේ.
(4) චෙක්පත් අංකය හා බැංකු ශාඛා අංකය වේ.
(5) බැංකු ශාඛා අංකයහා ගිණුම් අංකය වේ.

(………)

126. චෙක්පතකට උපරිම ආරක්ෂාව ලැබෙන සේ කළ යුතු රේඛනය වන්නේ,

1. ______________ ලෙස දැක්වීම යි.
2. මහජන බැංකුව ලෙස දැක්වීම යි.
3. ගනුදෙනුකළ නොහැක ලෙස දැක්වීම යි.
4. ආදායකයා ගේ ගිණුමට පමණයි.
   රු. 75000 ක් දක්වා පමණයි.
   ලංකා බැංකුව ලෙස දැක්වීම යි.
5. ගනුදෙනු කළ නොහැක
   ලංකා බැංකුව ලෙස දැක්වීම යි.

(………)

National Institute of Education

## ප්‍රශ්න සඳහා පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 5 | 46 | 3 | 91 | 2 | 136 | 2 | 181 | 4 |
| 2 | 1 | 47 | 2 | 92 | 4 | 137 | 2 | 182 | 1 |
| 3 | 3 | 48 | 3 | 93 | 1 | 138 | 3 | 183 | 4 |
| 4 | 3 | 49 | 4 | 94 | 1 | 139 | 5 | 184 | 2 |
| 5 | 2 | 50 | 3 | 95 | 5 | 140 | 5 | 185 | 2 |
| 6 | 3 | 51 | 5 | 96 | 1 | 141 | 3 | 186 | 2 |
| 7 | 3 | 52 | 5 | 97 | 3 | 142 | 3 | 187 | 3 |
| 8 | 4 | 53 | 3 | 98 | 3 | 143 | 2 | 188 | 5 |
| 9 | 3 | 54 | 1 | 99 | 4 | 144 | 2 | 189 | 1 |
| 10 | 4 | 55 | 5 | 100 | 3 | 145 | 4 | 190 | 5 |
| 11 | 2 | 56 | 2 | 101 | 1 | 146 | 3 | 191 | 4 |
| 12 | 1 | 57 | 4 | 102 | 2 | 147 | 2 | 192 | 3 |
| 13 | 3 | 58 | 3 | 103 | 1 | 148 | 2 | 193 | 3 |
| 14 | 1 | 59 | 1 | 104 | 5 | 149 | 5 | 194 | 3 |
| 15 | 3 | 60 | 1 | 105 | 2 | 150 | 4 | 195 | 2 |
| 16 | 1 | 61 | 1 | 106 | 5 | 151 | 1 | 196 | 5 |
| 17 | 3 | 62 | 2 | 107 | 4 | 152 | 4 | 197 | 1 |
| 18 | 5 | 63 | 2 | 108 | 2 | 153 | 3 | 198 | 1 |
| 19 | 2 | 64 | 4 | 109 | 2 | 154 | 4 | 199 | 1 |
| 20 | 3 | 65 | 3 | 110 | 2 | 155 | 4 | 200 | 4 |
| 21 | 4 | 66 | 2 | 111 | 2 | 156 | 2 | 201 | 1 |
| 22 | 1 | 67 | 3 | 112 | 3 | 157 | 1 | 202 | 5 |
| 23 | 5 | 68 | 5 | 113 | 4 | 158 | 2 | 203 | 5 |
| 24 | 4 | 69 | 2 | 114 | 2 | 159 | 1 | 204 | 4 |
| 25 | 4 | 70 | 1 | 115 | 1 | 160 | 5 | 205 | 5 |
| 26 | 4 | 71 | 2 | 116 | 1 | 161 | 2 | 206 | 1 |
| 27 | 5 | 72 | 5 | 117 | 4 | 162 | 2 | 207 | 5 |
| 28 | 2 | 73 | 5 | 118 | 5 | 163 | 3 | 208 | 2 |
| 29 | 4 | 74 | 4 | 119 | 4 | 164 | 2 | 209 | 2 |
| 30 | 1 | 75 | 3 | 120 | 2 | 165 | 5 | 210 | 4 |
| 31 | 2 | 76 | 1 | 121 | 3 | 166 | 4 | 211 | 5 |
| 32 | 1 | 77 | 4 | 122 | 1 | 167 | 2 | 212 | 2 |
| 33 | 3 | 78 | 3 | 123 | 5 | 168 | 3 | 213 | 3 |
| 34 | 1 | 79 | 4 | 124 | 5 | 169 | 3 | 214 | 5 |
| 35 | 1 | 80 | 3 | 125 | 2 | 170 | 5 | 215 | 2 |
| 36 | 4 | 81 | 4 | 126 | 4 | 171 | 5 | 216 | 5 |
| 37 | 4 | 82 | 2 | 127 | 2 | 172 | 5 | 217 | 3 |
| 38 | 1 | 83 | 3 | 128 | 3 | 173 | 5 | 218 | 2 |
| 39 | 1 | 84 | 3 | 129 | 4 | 174 | 1 | 219 | 4 |
| 40 | 3 | 85 | 2 | 130 | 3 | 175 | 1 | 220 | 5 |
| 41 | 2 | 86 | 4 | 131 | 2 | 176 | 5 | 221 | 2 |
| 42 | 3 | 87 | 3 | 132 | 3 | 177 | 1 | 222 | 4 |
| 43 | 2 | 88 | 2 | 133 | 4 | 178 | 3 | 223 | 3 |
| 44 | 2 | 89 | 4 | 134 | 4 | 179 | 4 | 224 | 2 |
| 45 | 1 | 90 | 5 | 135 | 5 | 180 | 5 | 225 | 4 |

National Institute of Education

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 226 | 1 | 251 | 4 | 276 | 3 | 301 | 2 | 326 | 1 |
| 227 | 5 | 252 | 4 | 277 | 2 | 302 | 5 | 327 | 1 |
| 228 | 2 | 253 | 1 | 278 | 3 | 303 | 4 | 328 | 2 |
| 229 | 5 | 254 | 5 | 279 | 5 | 304 | 3 | 329 | 4 |
| 230 | 5 | 255 | 3 | 280 | 2 | 305 | 3 | 330 | 1 |
| 231 | 2 | 256 | 5 | 281 | 4 | 306 | 2 | 331 | 3 |
| 232 | 1 | 257 | 5 | 282 | 3 | 307 | 3 | 332 | 1 |
| 233 | 2 | 258 | 4 | 283 | 4 | 308 | 5 | 333 | 4 |
| 234 | 5 | 259 | 5 | 284 | 4 | 309 | 3 | 334 | 1 |
| 235 | 2 | 260 | 3 | 285 | 2 | 310 | 3 | 335 | 3 |
| 236 | 3 | 261 | 4 | 286 | 4 | 311 | 5 | 336 | 2 |
| 237 | 4 | 262 | 3 | 287 | 3 | 312 | 3 | 337 | 5 |
| 238 | 4 | 263 | 2 | 288 | 1 | 313 | 1 | 338 | 1 |
| 239 | 3 | 264 | 1 | 289 | 2 | 314 | 1 | 339 | 3 |
| 240 | 2 | 265 | 2 | 290 | 2 | 315 | 1 | 340 | 3 |
| 241 | 4 | 266 | 2 | 291 | 4 | 316 | 1 | 341 | 5 |
| 242 | 4 | 267 | 3 | 292 | 1 | 317 | 4 | 342 | 2 |
| 243 | 3 | 268 | 3 | 293 | 1 | 318 | 5 | 343 | 1 |
| 244 | 5 | 269 | 1 | 294 | 5 | 319 | 2 | 344 | 5 |
| 245 | 2 | 270 | 3 | 295 | 4 | 320 | 3 | 345 | 2 |
| 246 | 4 | 271 | 5 | 296 | 2 | 321 | 3 | 346 | 3 |
| 247 | 5 | 272 | 3 | 297 | 3 | 322 | 2 | 347 | 3 |
| 248 | 3 | 273 | 4 | 298 | 3 | 323 | 2 | 348 | 2 |
| 249 | 3 | 274 | 5 | 299 | 2 | 324 | 3 | 349 | 1 |
| 250 | 3 | 275 | 1 | 300 | 4 | 325 | 4 | 350 | 3 |

National Institute of Education

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."